# 6 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## දෙවන වාරය

ක්‍රියාකාරකම :- තාලානුකූල ස්වර අභ්‍යාස ගායනය

## *තාලානුකූල ස්වර අභ්‍යාස*

සංගීත විෂය හදාරන දරුවන් ස්වර අභ්‍යාසයේ යෙදීම මුල සිටම කළ යුතු කාර් යයකි. සංගීත විෂය හදාරන ආධුනිකයෙක්ද ගායනයෙන් හෝ වාදනයෙන් ස්වර අභ්‍යාස වල යෙදිය යුතුය. ගායකයෙකු නම් තම කටහඬ පාලනය කර ගැනීමටත් නිවැරදි ස්වර ස්ථානවලින් යුක්තව ගායනය රසවත්ව ඉදිරිපත් කිරීමටත් ස්වර අභ්‍යාස වල යෙදීම අත්‍යවශ්‍ය වේ. ස්වර අභ්‍යාස තාලානුකූලව යොදා ගැනීමෙන් මිහිරිතාවය ඇති කළ හැකි වේ. එබැවින් තාලානුකූල ස්වර අභ්‍යාස වල රිද්මයක් හෝ තාලයක් ඇත.

ඔබ මීට පෙර පෙරදිග සංගීතයේ ස්වර 7 පිළිබඳවත් එම ස්වර 7න් ගොඩනැගෙන ස්වර අභ්‍යාස පිළිබඳවත් ඉගෙන ගන්නට ඇති.අපි ඒවා නැවත මතක් කර ගෙන බලමු..

පහත දැක්වෙන ස්වර අභ්‍යාසය ගොඩ නැගී ඇති අයුරු බලන්න.




දැන් ඔබ කොටු රූල් කඩදාසියක මෙම ස්වර අභ්‍යාසය ඉදිරියට ගොඩනගන්න උත්සහ කරන්න.

ඔබ ගොඩ නගා ගත් ස්වර අභ්‍යාසය පියවරෙන් පියවර ගායනය කිරීමට උත්සහ කරන්න.

දැන් මෙම ස්වර ස්ථාපන ගීතය දෙස හොඳින් බලන්න..

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ස - රි | ග ම - | ස රි ග | ම ප - | ස රි ග | ම ප ධ | නි - - | - - - |
| ඇ S ත | හි මේ S | ගි රි මු | දු නෝ S | සි සි ල | මැවෙ න | වා S S | S S S |
| ස - නි | ධ ප - | ස නි ධ | ප ම - | ස නි ධ | ප ම ග | රි - - | - - - |
| වැ S හෙ | න සී S | ත ල ග | ගු ලේ S | දි ය ට | කැවෙ න | වා S S | S S S |
| ස රි ග | රි ග ම | ග ම ප | - ප - | ම ප ධ | ප ධ නි | ධ නි ස | - ස - |
| ස ත ර | දි ග ට | ම හ ග | ◌ං ගා S | ස ත ර | අ ත ට | මි ණී හ | ◌ං ගා S |
| ස නි ධ | නි ධ ප | ධ ප ම | - ම - | ප ම ග | ම ග රි | ග රි ස | - ස - |
| අ ප ගෙ | ර ට ට | සෙ ත න | ◌ං ගා S | දෙ ව න | ම ව කි | ම හ ග | ◌ං ගා S |

මෙම ස්වර ස්ථාපන ගීතයේ ඔබ පෙර ගොඩ නැගූ ස්වර අභ්‍යාසය ඇතුළත් වී ඇති ආකාරය අධ්‍යයනය කරන්න..

**තවත් ස්වර අභ්‍යාසයක් ගොඩ නගමු..**




**පහත සදහන් ස්වර අභ්‍යාස උච්ච ස දක්වා ගොඩ නගන්න. එම ස්වර අභ්‍යාස ගායනයට හුරු වන්න.**

1. ස රි ග ම , රි ග ම ප , ..................................................................................

2. ස - සරිගරිස- ,රි-රිගමගරි, ...........................................................................

3. සරිගරිස,සරිගමගරිස, ..................................................................................

4. සරිග,රිගම, ..........................................................................................

5. සරිසරිග,රිගරිගම,......................................................................................

පහත ස්වර අභ්‍යාස වල 3න් වන පියවර ලියන්න උත්සහ කරන්න..

01..සරිගස,රිගමරි,..............

02..සගරිස,රිමගරි...............

03..සරිස,රිගරි,...................

04..සරිසග,රිගරිම,..............

05..සරිගරි,රිගමග,..............

දැන් ඔබට ස්වර අභ්‍යාස ගොඩනැගීම පිළිබදව අවබෝධයක් ලැබෙන්නට ඇති....

දැන්ඔබ තනිවම ස්වර අභ්‍යාස 5ක් උච්ච ස දක්වා නිර් මාණය කරන්න.....

01..

02..

03..

04..

05..

ඔබ ඇතුළු පවුලේ සියලු දෙනාට නිදුක් නිරෝගී බව පතමි.......